Lesson 40

# Conjunctions

කන්ජංක්ෂන්ස්

සම්බන්ධක පද

ඉංග්‍රීසි මූලික ව්‍යාකරණ  සුළු ප්‍රමාණයක් මේ වනවිට අපි ඉගෙන ගෙන තියෙනවා. ඒ සුළු දැනුම භාවිතා කරමින් වුවත් අපිට සරල වාක්‍ය ගොඩ නැගිය හැකියි. එවැනි  වෙනස් තේරුම් තිබෙන වාක්‍යය දෙකක් සම්බන්දක පදයක් යොදා ගෙන සම්බන්ද කලොත්, එවිට තවත් වැඩිපුර අදහස් ප්‍රකාශ කළ හැකියි. අපි දැන්  ඒ සදහා යම් උත්සහයක් ගෙන බලමු.

ඉංග්‍රීසියෙන් හොඳින් අදහස් පලකිරීමට නම් තව සෑහෙන දැනුමක් අපට එකතු වෙන්න ඕන.  බොහෝවිට මෙම පාඩම් මාලාවේ  දෙවන කොටස අවසන් වන විට ඔබට ඉතා හොඳින් ඉංග්‍රීසියෙන් අදහස් පල කිරීමේ හැකියාව ලැබේවි. එතෙක් අපිට දැනට තිබෙන මූලික  දැනුම භාවිතා කර සරල වාක්‍යය ගොඩ නැගීමටත්, එම වාක්‍යය සම්බන්ධ කර ඊට වඩා තරමක් සංකීර්ණ අදහස් ප්‍රකාශ කිරීමටත් උත්සාහ ගනිමු. ඒ සදහා අපිට අවශ්‍යයි සම්බන්ධක පද පිලිබඳ දැනීම. ඉංග්‍රීසි  භාෂාවේ වැදගත්ම පද විශේයක් තමයි මේ සම්බන්ධක පද. ඉංග්‍රීසි භාෂාවට එහි සුහුරු බව ලැබී තිබෙන ප්‍රධාන හේතුවක් මේ පද වල භාවිතය. සම්බන්ධක පද කීපයක් අපි මේ පාඩම් මාලාවේ මේ කොටසේදී ඉගෙන ගන්නවා

දැන් මේ වාක්‍ය දෙක බලමු

මට එන්න බෑ - I can’t come - අයි කාන්ට් කම්
මට අසනීපයි - I am ill - අයෑම් ඉල්

දැන් අපිට කියන්න අවශ්‍යයි ,

“ මට අසනීප නිසා මට එන්න බෑ කියල “

මේ අදහස් දෙක සම්බන්ධ කරන්න ,අපට “ නිසා “ කියන තේරුම දෙන සම්බන්ධක පදය අවශ්‍ය වෙනවා

“නිසා” කියන අදහස දෙන්න භාවිතා කරන්නනේ because – බිකෝස් කියන වචනය. අපි ඒ වචනය පාවිච්චි කරලා “ මට අසනීප නිසා” කියන වාක්‍යය ගොඩ නගමු .

“මට අසනීපයි “ කියන වාක්‍යය ඉදිරියට because  දැම්මම “මට අසනීප නිසා කියන තේරුම එනවා

මට අසනීපයි - I am ill - අයැම් ඉල්
මට අසනීප නිසා - because I am ill - බිකෝස් අයැම් ඉල්
මට එන්න බෑ - I can’t come

දැන් අපි සම්පූර්ණ වාක්‍යය හදමු

I can’t come because I am ill
අයි කාන්ට් කම් බිකෝස් අයැම් ඉල්
මට එන්න බෑ මට අසනීප නිසා

ඒ වාක්‍යය දෙක මාරු කරලා කියන්නත් පුළුවන්

Because I am ill, I can’t come
බිකෝස් අයැම් ඉල්, අයි කාන්ට් කම්

තවත් ලස්සන උදාහරණයක් බලමු

මට ඒක මිලට ගන්න බෑ මට සල්ලි නැති නිසා

මට ඒක මිලට ගන්න බෑ - I can’t buy it - අයි කාන්ට් බයි ඉට්
මට සල්ලි නෑ - I have no money - අයි හැව් නෝ මනි

දැන් ඊළගට මට සල්ලි නැති නිසා කියන වාක්‍යය හදමු

මට සල්ලි නැති නිසා - because I have no money - බිකෝස් අයි හැව් නෝ මනි

දැන් මේ අදහස් දෙක සම්බන්ධ කරලා සම්පූර්ණ වාක්‍යය ගොඩ නගමු

I can’t buy it because I have no money
අයි කාන්ට් බයි ඉට් බිකෝස් අයි හැව් නෝ මනි
මට ඒක ගන්න බැහැ මට සල්ලි නැති නිසා

වාක්‍යය දෙක මාරු කරලා ලියන්නත් පුළුවන්

Because I have no money, I cannot buy it
බිකෝස් අයි හැව් නෝ මනි , අයි කැනොට් බයි ඉට්
මා ලග සල්ලි නැති නිසා මට ඒක ගන්න බෑ

තව උදාහරණයක් බලමු

මම ආපහු  යනවා රැස්වීම අවලංගු නිසා

මම ආපහු යනවා - I am going back - අයැම් ගොයිං බැක්
රැස්වීම අවලංගුයි - The meeting is cancelled - ද මීටින් ඉස් කැන්සල්ඩ්

මීලගට රැස්වීම අවලංගු නිසා කියන වාක්‍යය හදමු

රැස්වීම අවලංගු නිසා - because the meeting is cancelled - බිකෝස් ද මීටින් ඉස් කැන්සල්ඩ්

දැන් පුලුවන් සම්පුර්ණ වාක්‍යය ගොඩ නගන්න

I am going back because the meeting is canceled
අයැම් ගොයිං බැක් බිකෝස් ද මීටින් ඉස් කැන්සල්ඩ්
මම ආපහු යනවා රැස්වීම අවලංගු නිසා

මෙහිදීත් අවශ්‍ය නම් වාක්‍යය දෙක මාරු කර කිව හැකියි . Because යොදා වාක්‍යය දෙකක් සම්බන්ධ කරන ඕනෑම අවස්ථාවක ඒ වාක්‍යය දෙක මාරු කර කිව හැකියි. තේරුමේ වෙනසක් වෙන්නේ නැහැ .නමුත් බොහෝවිට මේ වාක්‍යය ස්වභාවිකව කියවෙන විදියක් තියෙනවා. ඒ විදියට තමයි අපි බොහෝවිට මේ වාක්‍යය ඔබට ඉදිරිපත් කරන්නේ

මේ තව උදාහරණයක්

ඇය බෙහෙත් ගන්නවා ඇය අසනීපෙන් නිසා

ඇය බෙහෙත් ගන්නවා - she takes medicine - ෂී ටේක්ස් මෙඩිසින්
ඇය අසනීපෙන් - she is ill - ෂී ඉස් ඉල්

මීලගට because යොදා ඇය අසනීපෙන් නිසා කියන වාක්‍යය ගොඩ නගමු

ඇය අසනීපෙන් නිසා - because she is ill - බිකෝස් ෂී ඉස් ඉල්

දැන් සම්පුර්ණ අදහස දෙන වාක්‍යය ගොඩ නගමු

She takes medicine because she is ill
ෂී ටේක්ස් මෙඩිසින් බිකෝස් ෂී ඉස් ඉල්
ඇය අසනීප නිසා ඇය බෙහෙත් ගන්නවා

තවත් උදාහරණයක්

අද නිවාඩු දවසක් නිසා මම ගෙදර

අද නිවාඩු දවසක් - Today is a holiday - ටුඩේ ඉස් අ හොලිඩේ
අද නිවාඩු දවසක් නිසා - Because today is a holiday - බිකෝස් ටුඩේ ඉස් අ හොලිඩේ
මම ගෙදර - I am at home - අයෑම් ඇට් හෝම් - මම ගෙදර

I am at home because today is a holiday , I am at home
අයෑම් ඇට් හෝම් බිකෝස් ටුඩේ ඉස් අ හොලිඩේ
අද නිවාඩු දවසක් නිසා මම ගෙදර

තව උදාහරණයක්

මට ඒක උස්සන්න බැහැ ඒක ගොඩක් බර නිසා

මට ඒක උස්සන්න බැහැ - I can't lift it - අයි කාන්ට් ලිෆ්ට් ඉට්
ඒක ගොඩක් බරයි - It is very heavy - ඉට් ඉස් වෙරි හෙවි (It is කියන එක It 's(ඉට්ස් ) කියල කෙටි කරලා ගන්න පුරුදු වෙමු මෙතැන් සිට )

ඒක ගොඩක් බර නිසා - Because it's very heavy - බිකෝස් ඉට්ස් වෙරි හෙවි

I can't lift it because it's very heavy
අයි කාන්ට් ලිෆ්ට් ඉට් බිකෝස් ඉට්ස් වෙරි හෙවි
මට ඒක උස්සන්න බැහැ ඒක ගොඩක් බර නිසා

Because සම්බන්ධ පදය යෙදෙන තවත් උදාහරණ වාක්‍යය කීපයක් ගනිමු

She is happy because she passed the exam.
ෂී ඉස් හැපී බිකෝස් ෂී පාස්ඩ් දි එග්සෑම්.
ඇය සතුටින් ඉන්නේ ඇය විභාගය පාස් වුන නිසා

I'm tired because I worked all day
අයිම් ටය(ර්)ඩ් බිකෝස් අයි ව(ර්)ක්ඩ් ඕල් ඩේ
මට මහන්සියි මම දිනය පුරා වැඩ කළ නිසා

I stayed at home because it was raining
අයි ස්ටේඩ් ඇට් හෝම් බිකෝස් ඉට් වෝස් රේනිං
මම ගෙදර හිටියා, වැස්ස නිසා

She cried because she lost her bag
ෂී  ක්‍රයිඩ් බිකෝස් ෂී  ලොස්ට් හ(ර්) බෑග්
ඇය ඇඩුවා ඇයගේ බෑගය නැති වුන නිසා

I went to bed early because I felt sleepy
අයි වෙන්ට් ටු බෙඩ් අ(ර්ලි  බිකෝස් අයි ෆෙල්ට් ස්ලීපි
මම වේලාසනින් නිදා ගන්න ගියා මට නිදිමත දැනුණු නිසා

She didn’t come because she was sick
ෂී ඩිඩන්ට් කම් බිකෝස් ෂී වෝස් සික්
ඇය ආවේ නැහැ ඇයට  අසනීප නිසා

She went home because she forgot her book
ෂී වෙන්ට් හෝම් බිකෝස් ෂී ෆොගොට්  හ(ර්) බුක්
ඇය ගෙදර ගියා  ඇයට  පොත අමතක වුනු  නිසා

I couldn’t call you because my phone died
අයි කුඩන්ට් කෝල් යූ බිකෝස් මයි ෆෝන් ඩයිඩ්
මට ඔයාට කෝල් කරන්න බැරිවුණා මගේ ෆෝන් එකේ බැටරි බැස්ස නිසා ( die -ඩයි කියන්නේ මැරෙනවා කියන එක ,died - ඩයිඩ් එහි අතීත කාලය .  phone  එකක් සම්පුර්ණයෙන් බැටරි බැහැල අක්‍රීය වෙන එක මෙතන අදහස් වෙන්නේ )

They are worried because the exam is close.
දේ ආ වොරීඩ්  බිකෝස් ද එග්සෑම් ඉස් ක්ලෝස්.
විභාගේ  ළඟ නිසා ඔවුන් අවිලෙන්  ඉන්නෙ

She fell because the floor was slippery.
ෂී ෆෙල් බිකෝස් ද ෆ්ලෝ වෝස් ස්ලිපරි.
ඇය  වැටුනා පොලොව ලිස්සන සුළු වුනු නිසා

She is crying because the teacher blamed her
ෂී ඉස් ක්‍රයිං බිකෝස් ද ටීච(ර්) බ්ලේම්ඩ්  හ(ර්)
ඇය  අඬනවා ටීචර් ඇයට  බැනපු නිසා

I’m running because I’m late.
අයිම් රනිං බිකෝස් අයිම් ලේට්.
මම දුවනවා මට පරක්කු නිසා

I will sleep early because I will have school tomorrow.
අයි විල් ස්ලීප් අ(ර්ලි  බිකෝස් අයි  හැව් ස්කූල් ටුමොරෝ.
මට හෙට ස්කෝලේ  තියෙන නිසා මම වේලාසනින් නිදා ගන්නවා

I stay home because I feel very weak.
අයි ස්ටේ හෝම් බිකෝස් අයි ෆීල් වෙරි වීක්.
මම ගෙදර ඉන්නවා මට හරි දුර්වල ගතියක් දැනෙන නිසා

ඉහත සියළුම උදාහරණ වල අවශ්‍ය නම් ඒ වාක්‍යය දෙක මාරු කර කිව හැකියි තේරුම වෙනස් නොවී

When - වෙන් - විට

මීලගට අපි ගනිමු when කියන සම්බන්ධක පදය . ඉන් අදහස් වෙන්නේ " විට " කියන එක . ඒ කියන්නේ යම් ක්‍රියාවක් සිදුවන අවස්ථාවේ / ඒ ක්‍රියාව සිදුවන විට

ඔයා එනවිට මට පත්තරයක් ගේන්න

මට පත්තරයක් ගෙන්න - bring me a newpaper -බ්‍රි මී අ නිව්ස්පේප(ර්)
ඔයා එනවා - you come - යූ කම්

මීලගට when යොදා ඔයා එන විට කියන අදහස දෙන වාක්‍යය ගොඩ නගමු

ඔයා එනවිට - when you come - වෙන් යූ කම්

දැන් අපි මේ අදහස් දෙක සම්බන්ධ කරමු

Bring me a newspaper when you come
බ්‍රින් මී අ නිව්ස්පේප(ර්) වෙන් යූ කම්
ඔයා එනකොට මට පත්තරයක් ගේන්න

මේකත් වාක්‍යය දෙක මාරු කරලා කියන්න පුළුවන්

When you come, bring me a newspaper කියල . නමුත් වඩාත් ස්වභාවිකව ඒ වාක්‍යය කියවෙන්න ඉඩ තිබෙන විදිය තමයි අපි ඔබට වැඩිපුරම ඉදිරිපත් කරන්නේ

තව උදාහරණයක්

තාත්තට කේන්ති වෙලාවට මම ඔහුට කතා කරන්නේ නෑ

තාත්තට කේන්තියි - Father is angry ෆාද(ර්) ඉස් ඇංග්‍රි

තාත්තට කේන්ති විට - when  father  is  angry - වෙන් ෆාද(ර්) ඉස් ඇංග්‍රි
මම ඔහුට කතා කරන්නේ නෑ - I don't talk to him අයි ඩෝන්ට් ටෝක් ටු හිම්

When father is angry, I don't talk to him
වෙන් ෆාද(ර්) ඉස් ඇංග්‍රි  අයි ඩෝන්ට් ටෝක් ටු හිම්
තාත්තට කේන්ති ගියාම මම ඔහු එක්ක කතා කරන්නේ නැහැ

මේ තවත් උදාහරණයක්

ඔහු කාර්ය බහුල වෙලාවට දුරකතනයට පිළිතුරු දෙන්නේ නෑ

ඔහු කාර්‍ය බහුලයි - He is busy -  හී ඉස්  බිසී
ඔහු කාර්‍යබහුල විට - when he  is busy - වෙන් හී ඉස්  බිසී

ඔහු දුරකතනයට පිළිතුරු දෙන්නේ නෑ - He doesn't answer the phone - හී ඩස්න්ට් ආන්ස්ව(ර්) ද ෆෝන්

He  does n 't answer  the phone when  he  is  busy
හී  ඩස්න්ට් ආන්ස(ර්) ද ෆෝන් වෙන් හී  ඉස් බිසී
ඔහුට  කාර්ය බහුල වෙලාවට ඔහු දුරකතනයට පිළිතුරු දෙන්නේ නැහැ

මෙහෙම කියන්නත් පුළුවන්

When he is busy he doesn't answer the phone
වෙන් හී ඉස්  බිසී හී ඩස්න්ට්  අන්ස්ව(ර්) ද ෆෝන්
ඔහුට  කාර්ය බහුල වෙලාවට ඔහු දුරකතනයට පිළිතුරු දෙන්නේ නැහැ

තවත් උදාහරණයක්

ඔයා නිදහස් වෙලාවක මට කෝල් එකක් දෙන්න

මට කෝල් එකක් දෙන්න - Give me a call - ගිව්  මී  අ කෝල්
ඔයා නිදහස් - you are free - යූ  ආ  ෆ්‍රී
ඔයා නිදහස් විට - when you are free - වෙන් යූ  ආ ෆ්‍රී

Give me a call when you are free
ගිව්  මී  අ කෝල් වෙන් යූ  ආ  ෆ්‍රී
ඔයා නිදහස් වෙලාවක මට කෝල් එකක් දෙන්න

When සම්බන්ධක පදයක් ලෙස යෙදෙන තවත් වාක්‍යය කිහිපයක් බලමු

Call me when you finish your work
කොල් මී වෙන් යූ ෆිනිෂ් යුව(ර්)  ව(ර්)ක්
ඔයාගේ වැඩ ඉවර වෙනකොට  මට ඇමතුමක් දෙන්න

We were happy when we heard the news
වී ව(ර්) හැපී  වෙන් වී හ(ර්)ඩ් ද නිව්ස්
පුවත අහපුවම  අපි සතුටු වුණා

She smiled  when she saw me
ෂී ස්මයිල්ඩ්  වෙන් ෂී සෝ  යූ
මාව දැක්කම ඇය  සිනාසුනා

I was sleeping when you called me
අයි වෝස් ස්ලීපිං වෙන් යූ කෝල්ඩ් මී
ඔයා මට කෝල් කරන කොට  මම නින්දේ හිටිය

I sleep when I am tired
අයි ස්ලීප් වෙන් අයෑම්  ටය(ර්)ඩ්
මට මහන්සි වෙලාවට මම නිදා ගන්නවා

You must wear a helmet when you ride a bike
යූ මස්ට් වෙයා අ හෙල්මට් වෙන් යූ රයිඩ් අ බයික්
බයික් පදින කොට ඔයා හෙල්මට් එකක් පැළඳිය යුතුයි

I will help you when I have time
අයි විල් හෙල්ප්  යූ වෙන් අයි හැව් ටයිම්
මට වෙලාව තියෙන විට මම ඔයාට උදව් කරන්නම්

Call me when the class is over
කෝල් මී වෙන් ද ක්ලාස් ඉස් ඕව(ර්)
පන්තිය ඉවර වෙලාවට මට කෝල් කරන්න

She reads a book when she is alone
ෂී රීඩ්ස් අ බුක් වෙන් ෂී ඉස් අලෝන්
ඇය තනියම ඉන්න වෙලාවට පොතක් කියවනවා

Tell me when you are ready
ටෙල් මී වෙන් යූ ආ රෙඩි
ඔයා ලැහැස්ති වුනාම මට කියන්න

Turn off the lights when you leave the room
ට(ර්)න් ඕෆ් ද ලයිට්ස් වෙන් යූ ලීව් ද රූම්
ඔයා කාමරයෙන් කාමරයෙන් එලියට යන කොට ලයිට්ස් ඕෆ් කරන්න

I will call you when I reach home
අයි විල් කෝල් යූ වෙන් අයි රීච් හෝම්
මම ගෙදර ආපුවම මම ඔයාට කෝල් කරන්නම්

She calls me when she needs help
ෂී කෝල්ස් මී වෙන් ෂී නීඩ්ස් හෙල්ප්
ඇයට උදව් ඕන උනාම ඇය මට කෝල් කරනවා

හොදයි , අපි මෙතනින් පටන් ගත් පාඩම ඉතාම වැදගත් පාඩමක් . සම්බන්ධක පද පිළිබඳ දැනුමත් සමග ඔබට ඉංග්‍රීසි භාෂාව තේරුම් ගැනීමේ සහ ඉන් අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව කිහිප ගුණයකින් වැඩි වෙනවා. ඒ නිසා සම්බන්ධක පද පාඩම ඉතාම හොදින් ග්‍රහණය කරගන්න

Lesson 40

## Spoken English

හොදයි අපි මේ වෙනකොට බොහොම වැදගත් Spoken English කොටස් ඉගෙන ගෙන තියෙනවා. දැන් අපි බලමු යම් යම් ශාරීරික අපහසුතා ඉදිරිපත් කරන ආකාරය ගැන. බොහෝවිට පාසලේදී , ගෙදරදී , නැත්නම් වෙනත් ඕනෑම තැනකදී අපිට ශාරීරික අපහසු තත්වයන් ඇති වෙන්න පුලුවන්. ඒවා ගැන කියන්න දැනුමක් තිබෙන එක ඉතාම ප්‍රයෝජනවත් ඔබට මෙම කෙටි සංවාද කිහිපය හරහා ඒ පිලිබඳ හොඳ දැනුමක් ලබා ගත හැකියි

Dialogue 1

A:  What’s wrong with you?
වට්ස් රෝං විත් යූ?
ඔයාට මොකද වෙලා තියෙන්නේ ?

B: I have a headache.
අයි හැව් අ හෙඩේක්.
මට හිසරදයෙක් තියෙනවා

A: Shall I give you a tablet ?
ෂැලයි ගිව් යූ අ ටැබ්ලට් ?
මම ඔයාට බෙහෙත් පෙත්තක්  දෙන්නද ?

B: Yes, please.
යෙස්, ප්ලීස්.
ඔව්, කරුණාකරල

Dialogue 02

A: Are you feeling alright?
ආ යූ ෆීලින් ඕල්රයිට්?
ඔයාට හරිද?

B: No, I feel dizzy.
නෝ, අයි ෆීල් ඩිසි
නෑ, මට ඔලුව නිලංකාර වෙනවා

A: Hold my hand. Let’s go into the class room
හෝල්ඩ් මයි හැන්ඩ්. ලෙට්ස්  ගෝ ඉන්ටු ද ක්ලාස් රූම්
මගේ අතින්  අල්ලගන්න. අපි පන්ති කාමරේට යමු

B: Thank you.
තැන්ක් යූ.
ස්තූතියි.

Dialogue 3

A: Why are you holding your stomach?
වයි ආ යූ හෝල්ඩිං යුව(ර්)  ස්ටමක්?
ඔයා බඩ අල්ලගෙන ඉන්නේ මොකො?

B: My stomach hurts.
මයි ස්ටමක් හ(ර්)ට්ස්.
මගේ  බඩ රිදෙනවා .

A: Did you eat something bad?
ඩිඩ් යූ ඊට් සම්තිං බෑඩ්?
ඔයා නරක දෙයක් කෑවද ?

B: Maybe. I’m not sure.
මේ බී. අයිම් නොට් ෂුව(ර්)
සමහර විට . මට හරියටම විශ්වාස නැහැ.

Dialogue 4

A: Are you okay?
ආ යූ ඕකේ?
ඔයා හොදින්ද ?

B: I have a stomachache
අයි හෑව් අ ස්ටමක්ඒක්
මට බඩේ වේදනාවක් තියෙනවා

A: Shall I call the teacher?
ෂැලයි කෝල් ද  ටීච(ර්)?
මම ගුරුතුමියට කතා කරන්නද ?

B: Yes, please.
යෙස්, ප්ලීස්.
ඔව්, කරුණාකරලා

Dialogue 5

A: Are you feeling okay?
ආ යූ ෆීලිං ඕකේ?
ඔයා හොදින්ද ?

B: I am feeling dizzy
අයැම් ෆීලින් ඩිසී
මට ඔලුව නිලංකාර වෙනවා වගේ

A: Do you want to rest?
ඩූ යූ වෝන්ට් ටු රෙස්ට්?
ඔයාට විවේක ගන්න ඕනද ?

B: Yes, just for a while.
යෙස්, ජස්ට් ෆෝ අ වයිල්.
ඔව්, ටික වෙලාවකට

A: Please lie down here
ප්ලීස් , ලයි ඩවුන් හියර්)
මෙතනින් ඇල වෙන්න

Dialogue 6

A: You look pale. What’s wrong?
යූ ලුක් පේල්. වට්ස් රෝං?
ඔයා සුදුමැලි වෙලා. මොකක්ද ප්‍රශ්නේ?

B: I feel like vomiting
අයි ෆීල් ලයික් වොමිටිං
මට වමනේ එන්න වගේ

A: Come, sit down here. Keep your head on the desk. I will bring something to drink
කම්, සිට් ඩවුන් හියර්). කීප් යුවර්) හෙඩ් ඔන් ද ඩෙස්ක්. අයි විල් බ්‍රිං සම්තිං ටු ඩ්‍රිංක්
එන්න , මෙතනින් වාඩිවෙන්න. ඩෙස් එකට ඔලුව තියාගන්න. මම මොනවා හරි බොන්න ගේන්නම්

B: Thanks
තැන්ක්ස්
ස්තූතියි

Dialogue 7

A: Why are you rubbing your eyes?
වයි ආ යූ රබිං යුව(ර්) අයිස්?
ඇයි  ඔයා ඇස් පොඩි කරන්නේ ?

B: Something went into my eye.
සම්තිං වෙන්ට් ඉන්ටු මයි අයි.
මගේ ඇහැට මොකක්ද ගියා

A: Let’s try to blow it off.
ලෙට්ස් ට්‍රයි ටු බ්ලෝ ඉට් ඕෆ්
අපි පිඹලා යවන්න බලමු

B: Okay, please try.
ඕකේ, ප්ලීස් ට්‍රයි.
හරි, කරුණාකර උත්සාහ කරන්න

Dialogue  8

A: You look tired.
යූ ලුක් ටය(ර්)ඩ්
ඔයාට මහන්සි පාටයි

B: I feel my head is heavy. I didn’t sleep well last night
අයි ෆීල් මයි හෙඩ් ඉස් හෙවි . අයි ඩිඩ්න්ට් ස්ලීප් වෙල් ලාස්ට් නයිට්
මට හිස බරයි  වගේ දැනෙනවා . මම ඊයේ රෑ හොඳට නිදා ගත්තේ නෑ

A: Take some rest in the class
ටේක් සම් රෙස්ට් ඉන් ද  ක්ලාස්
පන්තියේ ටිකක් විවේක ගන්න

B: Thank you
තෑන්ක් යූ
ස්තුතියි

Dialogue 9

A: You look sleepy.
යූ ලුක් ස්ලීපි.
ඔයාට නිදි මතයි වගේ

B: I slept very late last night. Now I feel very sleepy
අයි ස්ලෙප්ට් වෙරි ලේට් ලාස්ට් නයිට්. නව් අයි ෆීල් වෙරි ස්ලීපී
මම ඊයේ නිදාගත්තේ ගොඩක් පරක්කු වෙලා , දැන් මට හරිම නිදි මතයි

A: Try to wash your face
ට්‍රයි ටු වොෂ් යුව(ර්) ෆේස්
මුණ ටිකක් හෝදලා බලන්න

B: Okay, I will.
ඕකේ, අයි විල්.
හරි, මම (එහෙම) කරන්නම් .

Dialogue 10

A: Oh no, your wound is bleeding!
ඕ නෝ, යුව(ර්) වුන්ඩ් ඉස් බ්ලීඩින්!
අයියෝ, ඔයාගේ තුවාලෙන් ලේ ගලනවා

B: Yes, it just started.
යෙස්, ඉට් ජස්ට් ස්ටා(ර්)ටඩ්
ඔව්, මේ දැන් පටන් ගත්තේ

A: Let's go to the first aid room and dress the wound
ලෙට්ස් ගෝ ටු ද ෆස්ට් ඒඩ් රූම් ඇන්ඩ් ඩ්‍රෙස් ද වුන්ඩ්
අපි ප්‍රථමාධාර කාමරේට ගිහින් තුවාලෙට බෙහෙත් දා ගමු

B: Okay, I'll do that.
ඕකේ, අයිල් ඩූ දැට්
හරි, මම එහෙම කරන්නම්

Dialogue 11

A: My head is spinning. And I feel like fainting.
මයි හෙඩ් ඉස් ස්පිනිං. ඇන්ඩ් අයි ෆීල් ලයික් ෆේන්ට්ං.
මට ඔලුව කැරකෙනවා. මාව කලන්තේ කරන්න වගේ වගේ (දැනෙන්නේ ඒ වගේ )

B: Oh, what can I do for you?
ඔහ්, වට් කැනයි අයි ඩූ ෆෝ යූ?
ඔහ් , මම මොකක්ද කරන්න ඕන ඔයා වෙනුවෙන් ? (මගෙන් මොනවද කෙරෙන්න ඕන ?)

A: I feel like lying down somewhere.
අයි ෆීල් ලයික් ලයිං ඩවුන් සම්වෙයා(ර්)
මට කොහේ හරි ඇල වෙන්න හිතයි

B: Let's go to the sick room quickly.
ලෙට්ස් ගෝ ටු ද සික් රූම් ක්වික්ලි.
අපි ඉක්මනට අසනීප කාමරයට යමු.

Dialogue 12

A: I have chest pain. I cannot breathe properly.
අයි හැව් අ චෙස්ට් පේන්. අයි කැනොට් බ්‍රීද් ප්‍රොප(ර්)ලි.
මට පපුවේ වේදනාව තියෙනවා. මට හරියට හුස්ම ගන්න බෑ.

B: Oh no, do you have any illness?
ඔහ් නෝ, ඩූ යූ හැව් එනි ඉල්නස්?
අයියෝ, ඔයාට මොකක් හරි අසනීපයක් තියෙනවද ?

A: I have asthma.
අයි හැව් ඇස්මා.
මට ඇස්මා (ඇදුම) තියෙනවා.

B: Oh terrible. Do you have medicine for that now?
ඔහ් ටෙරිබල්. ඩූ යූ හැව් මෙඩිසින් ෆෝ දැට් නව්?
ඔහ් , හරිම භයානකයි. ඔයා ලග ඒකට බෙහෙත් තියෙනවද?

A: I forgot to bring
අයි ෆොගොට් ටු බ්‍රිං
මම ගේන්න අමතක වුනා

B: We need to see a doctor quickly. Wait, I will call a taxi
වී නීඩ් ටු සී අ ඩොක්ට(ර්) ක්වික්ලි. වේට්, අයි විල් කෝල් අ ටැක්සි
අපි ඉක්මනට වෛද්‍යවරයෙක්ව බලන්න ඕන. ඉන්න, මම ටැක්සියකට කතා කරන්න

**Vocabulary 40**

stock - ස්ටොක් - තොගය / තොග රැස් කරගන්නවා

else - එල්ස් - වෙන

elsewhere - එල්ස්වෙයා - වෙන කොහෙවත්

type - ටයිප් - වර්ගය

instead - ඉන්ස්ටෙඩ් - වෙනුවට

rainbow – රේන්බෝ – දේදුන්න

bright – බ්‍රයිට් – දීප්තිමත්

pale – පේල් – මලානික

colourful – කල(ර්)ෆුල් – වර්ණවත්

hour – අව(ර්) – පැය

minute – මිනිට් – මිනිත්තුව

second – සෙකන්ඩ් – තත්පරය

thunder – තන්ඩ(ර්) - ගොරවනවා , ගෙරවුම

lightning –ලයිට්නිං – විදුලි කොටනවා , විදුලිය , අකුණ

fog –ෆොග් – මීදුම

dew –ඩිව් –පිනි